**වයඹ පළාත් සභාව - 2017**

**-------------------------------**

වයඹ පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 අනෙකුත් ගිණුම්

------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2018 අගෝස්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුමේ නම | 2017 වර්ෂයට අදාළ | | |
|---|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) විසර්ජන ගිණුම් | 29 | 29 | - |
| (ii) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 76 | 72 | 04 |
| (iii) පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| (iv) වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 06 | 01 |
| (v) අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 14 | 14 | - |
| (vi) ආදායම් ගිණුම් | 26 | 26 | - |
| එකතුව | 153 | 148 | 05 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති වල මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පරිචයන් හා රාජ්‍ය අංශය විසින් ප්‍රගුණ කරනු ලබන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මුදල් පදනම මත ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති බව දක්වා තිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

(i) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ අනුමත අත්තිකාරම් කටයුත්තක් ලෙස විස්කම් නිවස පවත්වාගෙනයාම සඳහා වර්ෂ ගණනාවකට පෙර ලබාදී තිබුණු රු. 7,038,211 ක අත්තිකාරම් නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 45 ක ස්ථාන මාරු වී ගිය, මියගිය, සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතු මත නිරවුල් නොවූ සේවක ණය ශේෂවල එකතුව රු. 66,861,779 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-----------------------

(i) අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ණය ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.135,371,629 ක් දක්වා තිබුණද, එම ශේෂය වාණිජ අත්තිකාරම් ගිණුම් වලින් ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් එකිනෙකට හිලව් කිරීමෙන් පසුව වූ වටිනාකමක් විය.

(ii) පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 21 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ එකතුව රු. 49,703,777 ක් වූ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පොදු තැන්පත්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ඇතුළු ආයතන 13 ක වර්ෂ 02 ඉක්ම වූ රු. 3,193,847 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

---------------------------------------------------

ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් මාරවිල රෝහලට සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාදී තිබුණු වාහන 02 කට 2013 සහ 2014 වර්ෂවලදී සිදුවී තිබුණු අනතුරු වෙනුවෙන් එකතුව රු. 4,460,000 ක රක්ෂණ වන්දි අයකර ගත් බව සනාථ කරන තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| (i) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 3.5 වගන්තිය | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම/ වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීම සඳහා එකතු කරනු ලබන ගාස්තුවලින් සියයට 50 ක් පළාත් සභා අරමුදලට බැර නොකර වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක විශේෂ ගිණුමකට බැරකර තිබුණි. |
| (ii) වයඹ පළාත් සභාවේ මාර්ග සංවර්ධන ප්‍රඥප්තියේ 23(1) හා 33(1) වගන්ති | මාර්ග දෙපස ඉදිකිරීම් සීමාවන් නොතකා වාරියපොළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මඟින් නඩත්තු වන පාරවල් දෙකක අනවසර ඉදිකිරීම් සිදු කර තිබුණි. |
| (ආ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| (i) ප.මූ.රී. 475.1 | ක්‍රීඩා අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන හිටපු පළාත් පාලන කොමසාරිස් වෙත හා හිටපු සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙකු වෙත ලබාදී තිබූ ලැප්ටොප් පරිගණක 02 ක් ඇතුළු උපාංග 08 ක් 2018 අප්‍රේල් වනවිටත් ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) ප.මූ.රී. 492 | පාවිච්චිකළ නොහැකි බවට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයකින් හඳුනාගත් භාණ්ඩ පමණක් විනාශ කළහැකි වුවත්, එම ක්‍රියාවලියෙන් බැහැරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ විෂයයන් 68 ක් 2017 පෙබරවාරි මාසයේදී විනාශකර තිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 21/2013 හි 02 | • සති අන්තයේ හා නිවාඩු දිනවල රාජකාරී ඉටුකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් හා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් |

(ආ) සහ (ඇ) වගන්ති

තොරව නිලධාරිණියකට 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා නිවාඩු දින වැටුප් ලෙස රු.167,617 ක් ගෙවා තිබුණි.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 20 ක් සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල ලිත් මාසයකට දින 02 ක් ඉක්මවා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේ දින 254 ක් සඳහා රු.426,566 ක් නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 29/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

වාහන කොටස්වලට ගැලවීමකින් තොරව බාහිරින් පරික්ෂා කිරීමෙන් පසු ඉදිරිපත් කළ මිළ ගණන් මත අවස්ථා 13 කදී පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 06 ක රු.2,038,068 ක් වූ අභ්‍යන්තර අළුත්වැඩියාවන් සිදුකර තිබුණි. අළුත්වැඩියාවේදී සවි කරන ලද අමතර කොටස්වල මිල ගණන්වල සාධාරණත්වය තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ
------------------------------

2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 හි 02 වගන්තිය

“ළඟම පාසල හොඳම පාසල” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව වාහන කුලියට ලබාගෙන සමාලෝචිත වර්ෂයේදී වාහන 09 කට රු. 12,616,915 ක් හා 2016 වර්ෂයේදී වාහන 10 ක් සඳහා රු. 6,526,548 ක් ගෙවා තිබුණි.

(ඉ) වෙනත් චක්‍රලේඛ
---------------------

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය

වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පාසල් 02 ක දෙමහල් තාක්ෂණික ගොඩනැගිලි ඉදිකිරීමේදී සහ එක් පාසලක දෙමහල් කණිෂ්ඨ/

| | |
|---|---|
| | ද්විතියික විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී අනුමත සීමාව ඉක්මවා එකතුව රු. 5,181,370 ක අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. |
| (ii) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2013 දෙසැම්බර් 13 දිනැති අංක ව/අධ්‍යා/සාප/10/05/01 දරන ලිපිය | පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයේ වාහන සඳහා මාසිකව ඉන්ධන ලීටර් 450 ක් බැගින් අනුමත කර තිබුණද 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල අනුමත ඉන්ධන ප්‍රමාණය ඉක්මවා ලීටර් 3,604 ක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව පාවිච්චි කර තිබුණි. |

2.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-----------------------------------------------------------------

ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයකින් තොරව 2016 වර්ෂයේ රු.මිලියන 134.62 ක් වූ ශල්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි.

03. ආදායම් කළමනාකරණය
----------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 තථ්‍ය ආදායම | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 10.02, 10.03 | නිෂ්පාදනය හා වියදම මත බදු | 7,830.13 | 7,144.71 | 6,653.00 | 6,555.69 |
| 20.02 | බදු කුලී, පොලී, ලාභ හා ලාභාංශ | 235.00 | 249.31 | 298.00 | 211.46 |
| 20.03 | විකුණුම් හා ගාස්තු | 562.00 | 674.86 | 540.00 | 613.06 |
| 20.06 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම | 25.00 | 13.29 | 25.00 | 2.32 |
| | එකතුව | 8,652.13 | 8,082.17 | 7,516.00 | 7,382.53 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය තුල වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පළාත් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ආදායම් සංකේත 02 කට අදාල එකතු වටිනාකම රු. 10,892,093 ක්වූ හිඟ ආදායම් කපා හැර තිබුණි.

(ආ) රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රූඩ් 01 පර්චස් 10.3 ක ඉඩම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට දීර්ඝකාලීනව බදුදීම වෙනුවෙන් 2012 හා 2013 වර්ෂයන් සඳහා අයවියයුතු රු.691,680 ක් 2018 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරුණෑගල මහානගර සභා සීමාව තුල පිහිටි හෙක්ටයාර් 0.4135 ක භූමිය සහ එහි පිහිටි ගොඩනැගිල්ලක් පෞද්ගලික ආයතනයකට දීර්ඝ කාලීනව බදුදීම වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයවියයුතු රු. 28,000,000 ක බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 04. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 1,407,616,828 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 216,897,422 ක් විය.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2017 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 7,830.12 | 7,144.71 | 685.41 | 6,653.00 | 6,555.69 | 97.31 |
| බදු නොවන ආදායම් | 822.00 | 946.86 | (124.86) | 863.00 | 826.84 | 36.16 |
| රජයේ ප්‍රදාන | 33,052.02 | 28,664.95 | 4,387.07 | 35,345.88 | 25,700.77 | 9,645.11 |
| වෙනත් ලැබීම් | 185.00 | 107.25 | 77.75 | 195.03 | 135.72 | 59.31 |
| එකතුව | 41,889.14 | 36,863.77 | 5,025.37 | 43,056.91 | 33,219.02 | 9,837.89 |

| <u>වියදම්</u> | | | | | | |
|---|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 23,968.75 | 23,315.45 | 653.30 | 23,285.91 | 23,225.71 | 60.20 |
| අනෙකුත් පුනරාවර්තන | 6,949.39 | 5,490.89 | 1,458.50 | 6,073.60 | 4,998.35 | 1,075.25 |
| | 30,918.14 | 28,806.34 | 2,111.80 | 29,359.51 | 28,224.06 | 1,135.45 |
| ප්‍රාග්ධන වියදම් | 10,971.00 | 6,649.81 | 4,321.19 | 13,697.40 | 4,778.06 | 8,919.34 |
| එකතුව | 41,889.14 | 35,456.15 | 6,432.99 | 43,056.91 | 33,002.12 | 10,054.79 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය අතර අනුපාතය 5 : 1 ක් විය.

4.3 ආයතනය විසින් ආරම්භ කල යුතු නෛතික සිද්ධි

පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුම යටතේ හානි හා පාඩු ලෙස දැක්වෙන ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදුවූ මූල්‍ය වංචාව කපාහැරීම සඳහා ලබාදුන් රු. 13,609,655 ක් ආපසු අයකරගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම වංචාවට මහජන බැංකුව නීත්‍යානුකූලව වගකිව යුතු බවට තීරණය වුවහොත් වගකිව යුතු බැංකුවක් ලෙස එම පාඩුව ගෙවීමට කටයුතු කරන බව 2011 ජූනි 30 දින දන්වා තිබුණි.

05. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

5.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්

5.1.1 විගණන මතය

වයඹ පළාත් සභාවේ ස්ථාපිත අධිකාරි 09 සහ අරමුදල් 05 සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයන් ඉදිරිපත් කෙරුණි.

5.1.2 මානව සම්පත් සංවර්ධන අධිකාරිය

(අ) නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පළාත් මූල්‍ය රීති 274 ප්‍රකාරව පළාත් සභාවේ කිසිම බැංකු ගිණුමකින් බැංකු අයිරා පහසුකම ලබා ගැනීම තහනම් බව දක්වා තිබුණද එක් බැංකු ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට රු. 19,890,053 ක බැංකු අයිරාවක් පැවතුණි.

(ආ) කාර්ය සාධනය

------------------

ණය යෝජනා ක්‍රම 05 ක් යටතේ නිකුත් කර ආපසු ගෙවීමේ කාලය ඉක්මවා තිබුණු වර්ෂ 05 කට වඩා පැරණි ණය සහ හිඟ පොලී පිළිවෙලින් රු. 12,986,075 ක් සහ රු. 3,391,315 ක් විය. තවද, වර්ෂ 03 ක කාලය ඉක්මවා තිබුණු ණය වාරික එකතුව රු. 21,490,189 ක් විය.

(ඇ) අවිධිමත් පත්වීම්

-------------------

(i) අධිකාරිය විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ට පටහැනිව ස්ථිර පත්වීම් 16 ක් ලබා දී තිබුණු අතර, එම පත්වීම් වෙනුවෙන් 2014 ඔක්තෝබර් 24 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල සීමාව සඳහා එකතුව රු.19,573,064 ක් වූ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ii) අධිකාරියේ කාර්ය මණ්ඩලය තුල ක්ෂේත්‍ර සහායක නිලධාරියෙකුගේ අතිරික්තයක් පැවතියදී 2014 සහ 2015 වර්ෂවල ක්ෂේත්‍ර සහායක නිලධාරීන් 03 ක් සහ 2016 වර්ෂයේ කළමනාකරණ සහකාරවරයෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට එම අතිරික්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් එකතුව රු. 3,288,278 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

5.1.3 වයඹ සංවර්ධන අධිකාරිය

----------------------------

(අ) මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(i) ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2016 ඔක්තෝබර් 16 දින සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු අනුයුක්ත කර තිබුණි.

(ii) අනුමත නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු දෙක සහ ගණකාධිකාරී තනතුර සඳහා සුදුස්සන් බඳවා ගැනීමට කටයුතු නොකර වැඩ බැලීමේ පදනම මත එම තනතුරුවලට පත්කිරීම් සිදුකර තිබුණි.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

2014 වර්ෂයේ රු.මිලියන 53.3 ක් වැයකර ඉදිකර තිබුණු මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු 2017 වර්ෂය අවසන් වනවිටත් ආරම්භ කර නොතිබුණි.

5.1.4 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

-------------------------------------

එකතුව රු. 69,267,620 ක්වූ ආරම්භක ණයගැති ශේෂයෙන් රු.3,206,444ක් අනුමැතියකින් තොරව වර්ෂය තුල කපාහැර තිබුණි.

5.1.5 වයඹ ජනකලා පදනම

-------------------------

2017 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂ කිහිපයක් තිස්සේ දිගින් දිගටම පාඩු ලබමින් පවත්වාගෙන යන කුරුණෑගල විස්කම් අලෙවිසැලෙහි රඳවා ගෙන තිබූ තොග එකතුව රු. 4,010,243 ක් විය.

5.1.6 වයඹ පළාත් පරිසර අධිකාරිය

-----------------------------------

මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පාරිසරික බලපත්‍ර ලබා නොගෙන කර්මාන්ත පවත්වාගෙන යන කර්මාන්ත හිමියන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව පරිසර ප්‍රඥප්තිය බලාත්මක කර නොතිබුණ අතර, එවැනි කර්මාන්ත මඟින් පරිසරයට සිදුකරන හානිය අවම කර ගැනීමට ගතයුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග පිළිබඳව විධිමත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

5.1.7 කර්මාන්ත සේවා කාර්යාංශය

----------------------------------

(අ) ගෙවිය යුතු ගිණුම්

--------------------

හෙරලියාවල කර්මාන්තපුරයේ ඉඩම් බදු කුලී වලින් පළාත් සභා අරමුදලට ගෙවිය යුතු රු. 4,343,490 ක් හා පළාත් සභාවේ කර්මාන්ත ප්‍රවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 1,786,300 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

2014 වර්ෂයේ විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ 4.3.2 (අ) හා 4.4.1 (ආ) විගණන ඡේදවලට අදාලව 2017 මාර්තු 16 දින පවත්වන ලද පළාත් ගිණුම් කාරක

සභාවේ තීරණය පරිදි රු. 1,480,000 ක මුදල වගකිව යුතු සියලු නිලධාරීන්ගෙන් මාස තුනක් ඇතුළත අයකර ගිණුම් කාරක සභාවට දැන්විය යුතු වුවද, 2018 ජූලි 10 දින වනවිටත් අදාල සැපයුම්කරු වෙතින් අයකරගත් රු. 823,333 ක් පමණක් වයඹ ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) අවිධිමත් ගනුදෙනු
--------------------
සමාලෝචිත වර්ෂය තුල නිම කළ කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු දිරි දීමනා රු. 6,198,363 ක් වුවත්, රු. 13,165,646 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුලදී කර්මාන්ත 111 ක් නිම කිරීමට ප්‍රථම එකතුව රු. 2,089,500 ක් වු දිරිදීමනා අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

5.1.8 ප්‍රධාන අමාත්‍ය අරමුදල
-------------------------
2017 වර්ෂය සඳහා රු.3,936,000 ක්වූ අරමුදලේ සමස්ථ වියදමෙන් රු. 3,916,000 ක් වෛද්‍යාධාර සඳහා පමණක් වැය කර තිබුණු අතර ආධාර සැපයිය යුතු අනෙකුත් ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

5.1.9 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය
---------------------------------------------
(අ) කාර්ය සාධනය
----------------
අධිකාරිය පිහිටුවීම පිළිබඳ 2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය අනුව වූ අරමුණුවලට අදාලව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂය තුලදී ද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) නිශ්ක්‍රීය වත්කම්
----------------
රු.4,140,000 ක්වූ මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා රු.4,925,000 ක්වූ විසිතුරු මත්ස්‍ය තටාකාංගනය වර්ෂ 05 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

5.1.10 වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
----------------------------------------------
(අ) ලැබිය යුතු ගිණුම්
------------------
සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 සිට වර්ෂ 17 දක්වා අතර කාලයක සිට ලැබිය යුතු රු. 6,125,718 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 61 කින් අඩුවී තිබුණි.

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

අවස්ථා කිහිපයකදී අයකරගැනීමේ පදනම මත ලබාදී තිබුණු මාර්ග බලපත්‍රවලින් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අයවිය යුතු මුදල රු. 2,336,000 ක් විය.

5.1.11 වයඹ සමුපකාර සංවර්ධන අරමුදල

-------------------------------------

එක් සමුපකාර සමිතියකට රු. 25,000 ක් බැගින් වූ පුස්තකාල පොත් ලබාදීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම කාර්යය ඉටුකර නොතිබුණි.

5.1.12 ක්‍රීඩා අරමුදල

---------------

කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) කුලියාපිටිය ශිල්පශාලිකා මධ්‍යස්ථානය ආරම්භකර වර්ෂ 25 ක පමණ කාලයක් ගතවී තිබුණද, එම ආයතනය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කායවර්ධන අංශයට උපදේශකවරයෙකු නොමැතිවීම හේතුවෙන් එහි තිබෙන උපකරණ ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

----------------------------

5.2.1 කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව කාර්මික වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

----------------------------------------------------------------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ වාණිජ අත්තිකාරම් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ 10 ක් ඉක්මවා තිබුණු රු. 1,479,794 ක්වූ ලැබිය යුතු ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.2.2 වයඹ පුහුණු ආයතනයේ වාණිජ අත්තිකාරම් ගිණුම

-----------------------------------------------------

අනුමත වියදමේ උපරිම සීමාව රු.16,000,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුළු වියදම රු.16,779,064 ක් වූයෙන් රු. 779,064 කින් වියදමේ උපරිම සීමාව ඉක්මවා තිබුණි.

5.2.3 පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව පේෂකර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම

--------------------------------------------------------------------------------------------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ට වැඩි රු. 8,689,094 ක් වූ ණයගැතියන්ගෙන් රු. 6,726,643 ක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතුව තිබුණු අතර එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 28,992,754 ක්වූ නූල් තොගය වර්ෂ 03 ක අවශ්‍යතාවයද ඉක්මවා තිබුණි.

(ඇ) රු. 1,595,120 ක් වූ තොග ඌනතාවය සිදුවී වර්ෂ 02 ක් ඉක්මවා තිබුණද, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

5.2.4 කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්මික පාසැල් පවත්වාගෙන යාම සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම

-------------------------------------------------------------------------------------------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,566,880 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ පාරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය රු. 155,990 ක්වූ නමුත් වර්ෂය අවසානයට රු. 3,500,074 ක්වූ අමුද්‍රව්‍ය තොගයක් පැවතුණි.

06. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

6.1 කාර්ය සාධනය

----------------

6.1.1 අධ්‍යාපනය

-------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වයඹ පළාත තුළ පිහිටි පාසල්වලින් 2014, 2015 හා 2016 වර්ෂවල උසස් පෙළ විභාගයේ සියළු විෂයන් අසමත් වී තිබුණු සිසුන් සිටි පාසල් සංඛ්‍යාව පිළිවෙලින් 43 ක්, 52 ක් සහ 56 ක් වී තිබුණි.

(ආ) පුත්තලම අධ්‍යාපන කලාපයේ අ.පො.ස (උ.පෙළ) 2015 හා 2016 වර්ෂ සැසඳීමේදී අසමත්වීමේ ප්‍රතිශතය සියයට 40 සිට 35 දක්වා අඩු වී තිබුණද, ජීව විද්‍යාව, ගණිතය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන අංශවල සිසුන්ගෙන් සියයට 50 ඉක්ම වූ ප්‍රතිශතයක් අසමත් වී තිබුණි.

(ඇ) වයඹ පළාත තුළ පිහිටි පාසල්වලින් 2014, 2015 හා 2016 වර්ෂවල සාමාන්‍ය පෙළ විභාගයේ සියළු විෂයන් අසමත්ව තිබුණු සිසුන් සිටි පාසල් සංඛ්‍යාව පිළිවෙලින් 65 ක්, 30 ක් සහ 10 ක් වී තිබුණි.

(ඈ) කුලියාපිටිය, කුරුණෑගල, ගිරිඋල්ල සහ මහව කළාප අධ්‍යාපන කාර්යාලවලට අයත් පාසල්වල 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා භාෂාව, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, ඉතිහාසය හා ආගම යන ප්‍රධාන විෂයයන් සඳහා ලකුණු 40 ට වඩා අඩුවෙන් ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටි පාසල් සංඛ්‍යාව 2016 වර්ෂයේ තෙවන වාර පරීක්ෂණයේ 376 ක් හා 2017 වර්ෂයේ දෙවන වාර පරීක්ෂණයේ 374 ක් විය.

(ඉ) පුත්තලම කළාප අධ්‍යාපන කාර්යාලයේ වැඩසටහන් දෙකකට 2016 සහ 2017 වර්ෂවලදී ආයතන දෙකකින් ලැබී තිබුණු එකතුව රු.419,900 ක් අපේක්ෂිත කාර්යයන් සිදු නොකර 2018 මාර්තු වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) පුත්තලම අධ්‍යාපන කලාපයේ ගුරු සේවයේ ගුරුභවතුන් 58 ක් විදුහල්පති තනතුරුවල වැඩ ආවරණයට යොදවා තිබූ අතර, විදුහල්පති සේවයේ 51 ක් නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල සේවයේ යොදවා තිබුණි.

6.1.2 සෞඛ්‍ය

---------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොල්පිතිගම ප්‍රදේශයේ 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු 1,714 ක්වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව 2016 වර්ෂයේදී 2,321 ක් වශයෙන් සියයට 35 කින්ද, 2017 වර්ෂයේදී 4,065 ක් දක්වා සියයට 75 කින්ද වර්ධනය වී තිබුණි. ප්‍රාදේශීය රෝහල්වල ප්‍රමාණවත් පරිදි පුහුණු වෛද්‍යවරු නොමැතිවීම හා රුධිර කාන්දුකරන යන්ත්‍ර අවශ්‍ය ප්‍රමාණයට නොතිබීම රෝගය පාලනයට බෙහෙවින් බලපා තිබුණි.

(ආ) වකුගඩු, හෘදයාබාධ හා වෙනත් රෝග සඳහා ආණමඩුව දිසා රෝහලට වාර්ෂිකව බාහිර රෝගීන් 100,000 ක්, සායන රෝගීන් 30,000 ක් හා නේවාසික රෝගීන් 7,000 ක් පමණ ප්‍රතිකාර සඳහා පැමිණෙන බව නිරීක්ෂණය විය. එහෙත් එම රෝහලට ප්‍රමාණවත් විශේෂඥ වෛද්‍ය හා අනිකුත් වෛද්‍ය නිලධාරීන් සහ ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැතිවීම හේතුවෙන් රෝගීන් නිතර පුත්තලම සහ නිකවැරටිය රෝහල් වෙත මාරුකර යැවීමට සිදුවී තිබුණි.

(ඇ) කුඹුක්වැව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ වෛද්‍යවරයා සේවයට නොපැමිණෙන දිනවල සායනවලට පැමිණෙන රෝගීන්ට වෛද්‍ය පරීක්ෂණයකින් තොරව රෝගීන්ගේ කලින් රෝග විනිශ්චය තුන්ඩුවලට ඖෂධ සංයෝජක විසින් ඖෂධ නිකුත් කර තිබුණි.

(ඈ) වකුගඩු රෝගයේ අවදානම් කලාප ලෙස හඳුනාගෙන තිබෙන ගල්ගමුව සහ මහව ඇතුළු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 06 ක් සඳහා වකුගඩු රෝග පිළිබඳ වෛද්‍යවරුන් නොමැතිවීම, ගල්ගමුව සහ පොල්පිතිගම රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් නොමැතිවීම, ගල්ගමුව රෝහලට විශේෂඥ විකිරණවේදී වෛද්‍යවරයෙකු (Consultant Radiologist) ප්‍රමාණවත් සහායක සෞඛ්‍ය කාර්යය මණ්ඩලයක්, ජංගම වෛද්‍ය රසායනාගාරයක් සහ ප්‍රමාණවත් වාහන පහසුකම් නොතිබීම යන කාරණා හේතුවෙන් වකුගඩු රෝග නිවාරන කටයුතු ප්‍රශස්ථ මට්ටමින් කරගෙන යාමට නොහැකි වී තිබුණි.

(ඉ) ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම, ප්‍රවාහන පහසුකම් නොමැතිවීම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ප්‍රමාණවත් නොවීම සහ ධූමායන යන්ත්‍ර ප්‍රමාණවත් නොවීම යන හේතුන්මත වයඹ පළාත තුල ඩෙංගු මර්ධන කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එම තත්ත්වය තුල 2016 වර්ෂයේ 2,563 ක් වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 2017 වර්ෂයේදී 11,322 ක්

දක්වා සියයට 340 කින් සහ ඩෙංගු රෝගී මරණ සංඛ්‍යාව සියයට 02 සිට සියයට 24 දක්වා ඉහල ගොස් තිබුණි.

(ඊ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රු.144,000 ක් වූ ව්‍යාපෘති 02 ක්, දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ රු.20,100,000 ක් වූ ව්‍යාපෘති 02 ක් සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රු.10,300,000 ක් වූ ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) ලුණුවිල ප්‍රාදේශීය රෝහලේ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ රසායනාගාරයක් පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ වෙන්කර තිබුණද රසායනාගාර උපකරණ හා රසායනාගාර කාර්මික ශිල්පියෙකු නොමැතිවීම හේතුවෙන් 2017 මුල් අර්ධය තුල පමණක් රෝගීන් 222 දෙනෙකු වෙනත් රෝහල් වෙත මාරුකර යැවීමට සිදුවී තිබුණි.

(ඌ) දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පුත්තලම දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන්කල රු.100,000 ක මුළු ප්‍රතිපාදනයම ආපසු යවා තිබුණි.

(එ) ඩෙංගු මර්දන කටයුතු සඳහා වෙන්නප්පුව, දංකොටුව හා පුත්තලම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල වෙත ලබාදී තිබූ රු.154,000 ක ප්‍රතිපාදනවලින් සැලසුම්කල කාර්යය ඉටු නොකර රු.104,000 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඒ) තැලසීමියා රෝගය නිවාරනය කිරීමේ වැඩසටහන් වෙනුවෙන් 2017 මැයි 16 දින පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත නිදහස්කර තිබූ රු.2,188,000 කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.36,000 ක් පමණක් වැයකර තිබුණු බැවින් එම රෝග නිවාරණ කටයුතු ප්‍රමාණවත් අයුරින් ඉටුකර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහනේ විවිධ වැය විෂයයන් යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් රු.93,707,339 ක් අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් වියදම් නොකර ඉතිරි කර තිබූ අතර ඉතිරි කිරීමේ ප්‍රතිශතය සියයට 11 සිට සියයට 42 දක්වා පරාසයක් ගෙන තිබුණි.

6.1.3 අනෙකුත්

-----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හලාවත සමූපකාර සහකාර කොමසාරිස් කාර්යාලයට අයත් සමිති 62 ක් ඈවර කිරීම සඳහා ඈවරකරුවන් පත්කර වර්ෂ 02 සිට වර්ෂ 18 ක දක්වා කාලයක් ගතවී තිබුණද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය තුලදී වයඹ ප්‍රධාන අමාත්‍යාංශය වෙත වයඹ පළාතට අයත් පළාත් පාලන ආයතන 33 කින් ජල ව්‍යාපෘති සඳහා වූ ඉල්ලීම් 298 ක් ලැබී තිබුණද, පළාත් පාලන ආයතන 11 කට අදාල ඉල්ලීම් 17 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය යටතේ වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය ස්ථාපිත කර තිබුණද, එහි සඳහන් අරමුණු සහ කාර්යයන් ඉටු කිරීමට පළාත් ඒකකය අපොහොසත් වී තිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත කරුණු නිරීක්ෂණයන් විය.

(අ) පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය 2017 වර්ෂය තුල අවස්ථා 03 කදී නිලධාරීන් 28 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගීකරවීම වෙනුවෙන් රු.14,489,666 ක් වැයකර තිබුණද සුදුස්සන් තෝරාගැනීමේ ප්‍රතිපත්ති පිළියෙල කර නොතිබුණි.

(ආ) දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ වාහන මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොතිබියදී පළාත් මූල්‍ය රීති 30 හා 32 අනුව රු.29,700,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඇ) රිදීගම දිසා රෝහලේ සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් විසින් රු.847,928 ක ආධාර මුදලක් ලබාදීමට එකඟවී ඉන් රු.423,934 ක් 2017 අගෝස්තු 24 දින රෝහලට ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී කාර්යය ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය සඳහා අනුමත වාර්ෂික සැලැස්ම අනුව දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ දඹදෙනිය මූලික රෝහලේ සායනික අපද්‍රව්‍ය දහනය කිරීමේ ඒකකයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 15 ක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) රෝහල් 09 කට අයත් අක්කර 44 ක වපසරියකින් යුතු ඉඩම් හා වපසරිය නිශ්චය කල නොහැකි රෝහල් 03 කට අයත් ඉඩම්, එම රෝහල් ආරම්භකල දින සිට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම රෝහල්වල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු ඉටුකිරීමට බාධාවක් වී තිබුණි.

(ඊ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝහල් 06 ක කිසිදු නිල නිවාසයක් නොමැති අතර රෝහල් 30 ක වෛද්‍ය, හෙද ඇතුළු අනිකුත් නිල නිවාස 167 ක හිඟයක් පැවතුනි. එම තත්ත්වය තුල වෛද්‍ය ඇතුළු රෝහල් කාර්යය මණ්ඩලය එම රෝහල්වලට අනුයුක්ත කිරීමේදී ගැටළු ඇතිවීම නිසා රෝගී සත්කාර සේවාව සඳහා එය සෘජුවම බලපා තිබුණි.

(උ) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මගින් නව ඉදිකිරීම් ඇතුළුව නවීකරණය කර තිබුණු ගල්ගමුව මූලික රෝහලට ඖෂධ ගබඩාවක් ඉදිකිරීම සඳහා රු.මිලියන 64 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් සහ සැපයුම්කරුවන්ගේ ප්‍රමාදයන් හේතුවෙන් 2016 වර්ෂයේ රු.මිලියන 188.23 ක් වූ ශල්‍ය වෛද්‍ය උපකරණ නියමිත කාලය ඉක්මවා මාස 03 සිට මාස 06 දක්වා වූ කාල පමාවක් සහිතව සපයා ගැනීමට සිදුවී තිබුණි.

(එ) විදේශාධාර ව්‍යාපෘතියක් යටතේ ගල්ගමුව මූලික රෝහලේ රු.මිලියන 605 ක් පමණ වැයකර ඉදිකරන ලද වාට්ටු සංකීර්ණය සහිත ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබූ සියළු උපාංගවලින් සමන්විත අංග සම්පූර්ණ ශල්‍යාගාර දෙක, දැඩිසත්කාර ඒකකය, වකුගඩු රෝගීන් සඳහා වූ රුධිර කාන්දුකරන ඒකකය, නොමේරූ ළදරු ඒකකය, ලේ බැංකුව, එන්ඩෝස්කොපි ඒකකය හා වෛද්‍ය වායු පද්ධතිය යන අංශ සඳහා නියමිත වෛද්‍යවරු ඇතුළු අවශ්‍ය අනිකුත් කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි නොමැතිවීම හේතුවෙන් එම ඒකක සහිත ගොඩනැගිල්ල විවෘත කල 2017 ජූලි 20 දින සිට 2018 ජූනි 15 දින වනවිටත් නිශ්කාර්යව පැවතුණි.

(ඒ) විදේශාධාර ව්‍යාපෘතියක් මගින් ගල්ගමුව රෝහලට සියළු පහසුකම් ලැබී තිබුණු නමුත් පිරිසිදු ජලය සපයාගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඔ) ජලභීතිකා රෝගය වැලැක්වීම යටතේ 2017 වර්ෂයේදී සුනඛයින් 14,000 ක් වන්ද්‍යාකරණය සඳහා රු.14,800,000 ක් වූ ටෙන්ඩරය 2017 නොවැම්බර් 20 දින පිරිනමා තිබුණු අතර 2017 වර්ෂයේ වන්ද්‍යාකරණය කල සුනඛයින් 1,255 ක් හෙවත් සැලසුම්කල ප්‍රමාණයෙන් සියයට 09 ක් පමණක් විය.

(ඕ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව රු.362,322 ක් වැයකර 2016 වර්ෂයේදී අළුත්වැඩියා කරන ලද ලොරි රථයක් නිශ්කාර්යව තිබියදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ත්‍රිපෝෂ ප්‍රවාහනය කිරීමේ කටයුතු රු.2,025,438 ක මුදලකට පෞද්ගලික අංශයට ලබාදී තිබුණි.

(ක) වයඹ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ කුලියාපිටියේ මීගහකොටුව පිහිටි රජයේ බාලිකා රැඳවුම් නිවාසයේ තැබීමට අනුමත ළමුන් සංඛ්‍යාව 45 ක් වූවත් සමාලෝචිත වර්ෂය තුලදී සාමාන්‍ය නේවාසික රැඳවියන් සංඛ්‍යාව 70 ක් වූ අතර, අතිරික්ත රැඳවියන් සඳහා අවශ්‍ය පහසුකම්වල ඌණතාවයක් දක්නට ලැබුණි. එසේම බාලිකා රැඳවියන් පාසැල් අධ්‍යාපනය ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී සමාජගත කිරීමට පෙර ක්‍රමවත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

(ග) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කි.මී 5.5 ක දුර ප්‍රමාණයක් සහිත ගොකරැල්ල- කඳුලව මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු නොකිරීමෙන් ප්‍රදේශවාසීන්ගේ ජන ජීවිතය අඩාල වී තිබූ අතර මගී බස් රථ ධාවනය වර්ෂයක පමණ කාලයක සිට ඇනහිට තිබුණි.

(ච) ප්‍රධාන අමාත්‍යාංශය විසින් සුභසාධක සමිති/සංගම් වෙත බෙදා දීම සඳහා රු. 3,925,000 ක් වූ ප්ලාස්ටික් පුටු 1000 ක් හා ශබ්ද විකාශන යන්ත්‍ර 55 ක් ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකුගෙන් මිලදී ගෙන තිබුණි.

(ජ) ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2.5.1 වගන්තිය අනුව රජයේ සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු වෙනත් සේවයකට අවුරුදු 02 කට වැඩි කාලයකට මුදා නොහැරිය යුතු වූවත්, වයඹ පළාතේ ගුරුභවතුන් 50 ක් ත්‍රිවිධ හමුදාවේ ස්වේච්ඡා බලකායන්හි සක්‍රීය සේවය සඳහා මුදා හැර වර්ෂ 02 ක කාලය අවසන්ව තිබුණද නැවත ගුරු සේවයට වාර්තා කර නොතිබුණි. තවද 1991 වර්ෂයේ සිට 2016 වර්ෂය

දක්වා මෙම ගුරුභවතුන් 50 සඳහා එකතුව රු. 107,422,487 ක වැටුප් වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

(ට) වයඹ පළාතේ පාසල් 102 ක ගුරුභවතුන් 125 දෙනෙකු 2016 හා 2017 වර්ෂවල ලබාගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකරගතයුතු එකතුව රු. 1,797,966 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ගුරුභවතුන් 27 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු සඳහා අයකළයුතු මූල්‍යමය වටිනාකම ගණනය කර නොතිබුණි.

(ඩ) දඹදෙනිය මූලික රෝහලට 2016 සැප්තැම්බර් 28 දින සිට භෞත චිකිත්සක නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණද භෞත චිකිත්සක අංශයක් ස්ථාපිත කර නොතිබුණි. එසේම භෞත චිකිත්සක කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර නොමැතිවීම නිසා යන්ත්‍ර භාවිතයෙන් තොරව භෞත චිකිත්සක කටයුතු කිරීමට නිලධාරීන්ට සිදුවී තිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.14,320,698 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණද, අක්මුදල් ලබාගෙන අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයේදී සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) උපමාන පාදක ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 ක ප්‍රතිපාදන වලින් එහි අරමුණුවලට පටහැනිව රු.882,506 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ඇ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ඖෂධ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු හා නිෂ්පාදනය කලහැකි ඖෂධ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනය නොකිරීම හේතුවෙන් එම ඖෂධ බාහිරින් මිලදී ගැනීම වෙනුවෙන් 2017 වර්ෂය තුල රු.5,141,795 ක් වැයකර තිබුණි.

(ඈ) ගල්ගමුව මූලික රෝහල සඳහා ලේ බැංකුවක් ආරම්භ කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මගින් ගොඩනැගිල්ලක් ඉදිකර දී තිබුණද, ඊට අවශ්‍ය උපකරණ හා මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) රෝහල් 09 ක ඖෂධ ගබඩාවල පවතින ගොඩනැගිලිවල ඉඩ ප්‍රමාණවත් නොවීම, වායු සමීකරණ පහසුකම් නොමැතිවීම, ශීතකරණ පහසුකම් නොමැතිවීම හා ප්‍රමිතියකින් තොරව ඖෂධ ගබඩා කිරීම යන හේතුමත ගබඩාකර ඇති ඖෂධවල ගුණාත්මකභාවය හා ආරක්ෂාව කෙරෙහි බලපෑම් ඇති විය හැකිව තිබුණි.

(ඊ) පරිසර හිතකාමී ලෙස සායනික අපද්‍රව්‍ය විනාශ කල යුතු වුවද රෝහල් 06 ක දහනාගාර නොමැතිව එලිමහනේ ඒවා විනාශ කරන බව හා රෝහල් 05 ක දහනාගාර පැවතියද නිසි ප්‍රමිතියකින් තොරව අපද්‍රව්‍ය දහනය කිරීම සිදු කරන බව නිරීක්ෂණය විය.

(උ) දඹදෙනිය මූලික රෝහලේ වාට්ටු, සායන වලින් හා මුළුතැන්ගෙයින් ඉවත්වන අපවිත්‍ර ජලය ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය හරහා පරිසරයට හානිදායක අයුරින් අසල පිහිටි ගංඟාවට දිගු කාලයක සිට එකතුවීමට ඉඩහැර තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ ප්‍රතිපාදන මගින් නිකවැරටිය මූලික රෝහලට මිලදීගත් රු.8,360,386 ක් වටිනා වෛද්‍ය උපකරණ 16 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රෝහල වෙත ලැබී නොතිබුණි.

(එ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා අනුව හිඟ බදු ආදායමෙන් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් අය වියයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක්වූ අතර, අයවියයුතු බදු මුදල් එකතුව රු.11,675,724 ක් විය.

(ඒ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව වාහන 53 ක් තිබුණද, පළාත් මූල්‍ය රීති 561 හි 10 (ඇ) පරිශිෂ්ඨයේ දැක්වෙන ආකාරයට වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට ගත නොහැකිව පවතින වාහන 10 ක් අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඔ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.3,400,743 ක් වූ විසුරුම් තවාන් තැටි, ලිපිද්‍රව්‍ය, පොලිතීන්, එළවලු රාක්ක, කැනපි හට් සහ එලවලු ඇසුරුම් බෑග් මිලදීගෙන තිබුණි.

(ඕ) අස්වැද්දුම වැවෙහි රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම සඳහා රු. 400,000 කට ගොවි සංවිධානයක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. ඇස්තමේන්තුව අනුව පස් කියුබ් 310 ක් ඉවත් කළයුතු වුවද, පස් කියුබ් 1,740 ක් ඉවත් කර ඇති බව අනාවරණය විය. ප්‍රමිතියකින් හා මග පෙන්වීමකින් තොරව අධික ලෙස රොන්මඩ සහිත පස් ඉවත් කිරීමට ඉඩහැරීම හේතුවෙන් වැව තුළ වලවල් සෑදී තිබුණි.

(ක) හලාවත මහවැවෙහි ජලජ ශාක සහ අපද්‍රව්‍ය ඉවත් කර පූර්ණ ප්‍රතිසංස්කරණයක් සඳහා රු.499,999 ක ඇස්තමේන්තුවකට ගිවිසුම්ගතවී තිබුණු අතර, වැවෙහි විශාල වශයෙන් පස් කපා ප්‍රවාහනය කරන බව 2017 ඔක්තෝබර් 17 දින භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, නාන මංකඩ ප්‍රතිසංස්කරණය කරන බව දක්වා බැකෝ යන්ත්‍ර යොදා ගෙන අනවසර වැලි කැණීම් කර නාන මංකඩ අසල ගොඩ ගසා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේදී ධීවරයින් වෙත බෙදාහැරිමට අපේක්ෂිත භාණ්ඩ නිසි ලෙස හඳුනාගෙන සැලසුම් සහගතව ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියට ඇණවුම් භාරදී නොතිබුණු අතර, කෘෂිකර්ම අමාත්‍යාංශය සියයට 50 ධීවර දායකත්වය ලැබූ රු.3,480,994 ක්වූ ධීවර ආම්පන්න 2017 නොවැම්බර් මාසයේ ඇණවුම් කර තිබූ හෙයින් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් බෙදාහැරීමට නොහැකිවී තිබුණි.

(ච) ප්‍රධාන ලේකම්ගේ අනුමැතියකින් තොරව 2004 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වයඹ සමූපකාර ග්‍රාමීය බැංකුවෙහි ආරම්භ කර තිබූ ප්‍රකෘති චක්‍රීය ණය අරමුදලෙන් 2005 හා 2006 වර්ෂවලදී දඹදෙණි සංවර්ධන පදනමට ගිවිසුමකින් තොරව ලබාදී තිබුණු ණය මුදලින් රු.608,578 ක් සහ නිශ්චිත කොන්දේසි ඇතුළත් කිරීමකින් තොරව 2011 වර්ෂයේදී මහජන බැංකුව සමඟ ඇතිකරගත් ගිවිසුමක් පරිදි බාහිර පුද්ගලයෙකුට ලබාදී තිබූ ණය මුදලින් රු.94,929 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ජ) වයඹ පළාත තුළ වූ පාසල් 791 ක ශිෂ්‍ය ඩෙස් 31,667 ක්, ශිෂ්‍ය පුටු 32,089 ක්, ගුරු මේස 5,440 ක් සහ ගුරු පුටු 7,046 ක් වශයෙන් ඌනතාවයන් පැවති නමුත් ඒවා සැපයීමේ කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ට) දුෂ්කර, අතිදුෂ්කර හා හුදකලා පාසල්වල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ට බෙදාදීම වෙනුවෙන් 2017 පෙබරවාරි සිට ජූලි දක්වා කාලය තුළදී කුලියාපිටිය, කුරුණෑගල, ගිරිඋල්ල, නිකවැරටිය, මහව සහ ඉබ්බාගමුව කලාප කාර්යාලවලට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදී තිබුණු නිල ඇඳුම් රෙදි පැකට් 36,632 ක් 2017 නොවැම්බර් වන විටත් අදාල පාසල් වෙත බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) මහව කළාප අධ්‍යාපන කාර්යාලය වෙත 2017 මැයි, ජූනි සහ ජූලි මාසවලදී යවා තිබූ සිසුන් 420 දෙනෙකුගේ ශිෂ්‍යාධාර රු.9,234,000 ක් සිසුන්ගේ ගිණුම්වලට බැර කිරීමේ කාල ප්‍රමාදය මාස 04 ක් විය.

(න) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 සැප්තැම්බර් 06 දිනැති අංක 24/2016 දරන සංවර්ධන ඉලක්ක අරමුණු කර ගෙන දිවයිනේ සියලු පාසල්වල ප්‍රධාන සැලැස්ම

(Master Plan) සකස් කිරීමට අදාල චක්‍රලේඛය අනුව වයඹ පළාතේ පාසල් 1,215 ක් සඳහා 2017 නොවැම්බර් 19 දින රු. 42,490,000 ක් ලබා දී තිබුණු නමුත් පාසල් 282 ක් 2018 ජුනි 30 දින වන විටත් ප්‍රධාන සැලැස්ම සකස් කර නොතිබුණි.

6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි හෙක්ටයාර් 0.1910 ක් වූ ඉඩම් ප්‍රමාණයක් ගිවිසුමකින් තොරව 1992 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයකට භුක්ති විඳීමට ඉඩ සලසා තිබුණි. 1992 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව බදු මුදල් අයකර නොතිබුණු අතර, තක්සේරු වාර්තාවක් මගින් බදු මුදල් නිශ්චය නොකර 2001 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මසකට රු.100 ක් බැගින් අයකරගෙන තිබුණි.

(ආ) තිත්තවැල්ල වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මිලගණන් ලබාගැනීමකින් සහ විධිමත් පරිදි ගිවිසුම්ගත වීමකින් තොරව ලබාගත් බැකෝ යන්ත්‍රය සඳහා 2017 දෙසැම්බර් 30 දින රු.300,000 ක් ගෙවීමේදී කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම් දැක්වෙන ලිපිය වාරිමාර්ග අධ්‍යක්ෂවරිය විසින් පිළියෙල කර තිබුණි.

(ඇ) වයඹ පළාතේ පාසල් පාදක ඉගෙනුම් සංවර්ධන ප්‍රදාන (SBLIG) මුදල්වලින් 2018 ජූනි 29 දින පත්වීම් ලද නවක උපාධිධාරීන්ගේ පුහුණු වැඩසටහන් වෙනුවෙන් රු. 2,000,000 ක් වැය කර තිබුණි.

(ඈ) නිකවැරටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීමට යකඩ කිලෝග්‍රෑම් 7,110 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර, ගොඩනැගිල්ලේ සැලකිය යුතු වෙනසක් සිදු නොවී තිබියදී ඇස්තමේන්තුව ඉක්මවා යකඩ කිලෝග්‍රෑම් 3,357 මිලදී ගැනීම වෙනුවෙන් රු. 671,400 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) කුලි / ශාන්ත ජෝශප් විද්‍යාලීය තෙමහල් ගොඩනැගිල්ල "සැලසුම් කර ඉදිකිරීම" (මැනුම්පත් සකස් කිරීමෙන් තොරව) යටතේ ඉදිකරන ව්‍යාපෘතියක් බැවින් මාසික භෞතික ප්‍රගති වාර්තා පදනම් කර ගෙන බිල්පත් ගෙවීම් කළ යුතු වුවත් එවැනි වාර්තා කිසිවක් නොමැතිව අවස්ථා 06 කදී රු. 34,415,308 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඊ) කුලි/ වීරඹුව කණිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගිවිසුම් කාල සීමාව 2016 නොවැම්බර් 16 දින සිට 2017 නොවැම්බර් 15 දින දක්වා විය යුතු වුවත්, 2018 ජනවාරි වන විටත් නිර්මාණ වලින් සියයට 50 ක් වත් කොන්ත්‍රාත්කරු විසින්

ඉංජිනේරු ආයතනයට භාරදී නොතිබියදී නිර්මාණ සකස් කිරීම සඳහා රු.1,542,500 ක් ගෙවා තිබුණි.

6.5 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පාසල් පාදක ඉගෙනුම් සංවර්ධන ප්‍රදාන (SBLIG) යටතේ වයඹ පළාත් පාසල් 1,215 කට රු.58,000,000 ක් ලබාදී තිබුණද, 2018 ජුනි 30 දින වන විටත් එම මුදලින් රු.25,285,000 ක් ඉගෙනුම් සංවර්ධනය වෙනුවෙන් වැය කර නොතිබුණි.

(ආ) අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව සහිත තාක්ෂණ විද්‍යාගාර පාසල්වල ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා භාණ්ඩ කට්ටල ලබා ගැනීම වෙනුවෙන් වයඹ පළාතේ තෝරා ගත් පාසල් 18 කට රු. 200,000 ක් බැගින් ලබාදී තිබුණද, පාසල් 17 ක් 2018 ජුනි 30 වන විටත් අවශ්‍ය උපකරණ මිලදී ගෙන නොතිබුණි.

(ඇ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ශීර්ෂ 06 කට අදාල වැය විෂයයන් 11 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන වටිනාකම රු.16,973,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ඈ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ශීර්ෂ 11 කට අදාල විවිධ වැය විෂයයන් 30 ක රු. 8,315,220,930 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් රු. 4,488,864,998 ක ඉතිරිවීම් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 98 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

6.6 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පඬුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුල පිහිටි අක්කර 11, රූඩ් 02 ක ඉඩම්, එම ඉඩම්වල පිහිටි පාසැල් ගොඩනැගිලි 08 ක් හා රජයේ ගොඩනැගිලි 04 ක් වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව /ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුල පිහිටි ඉඩම් කැබලි 11 ක් හා ඒවායේ ඉදිකර තිබෙන වර්ග අඩි 10,614 කින් යුත් ගොඩනැගිලි 14 ක් වර්ෂ 02 සිට වර්ෂ 28 දක්වා කාල සීමාවක් තුල ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඈ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුල පිහිටි අක්කර 48.5 ක වපසරියකින් යුත් ඉඩම් හා වර්ග අඩි 5,400 කින් යුත් ගොඩනැගිලි දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා තිබුණි.

(ඇ) මාවතගම දිස්ත්‍රික් රෝහලේ වාට්ටු අංක 03 සඳහා 2011 පෙබරවාරි 22 දින ලැබී තිබුණු ළමා ඇඳන් සහිත උපකරණයන් (Open cave System Radiant Warmer) භාවිතා නොකර බහාලූ පෙට්ටිය තුලම තිබුණි.

(ඉ) මාවතගම දිස්ත්‍රික් රෝහලේ තෙමහල් ගොඩනැගිල්ලේ ඉහල මහල හා එහි ඇති ඇඳන් 32 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝහල්වල පමණක් රු.55,239,725 ක් වූ ගුණාත්වයෙන් අඩු ඖෂධ තොගයක් පැවතුණි.

(උ) වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ 02 හි සහ රෝහල් හා අනිකුත් සෞඛ්‍ය වෛද්‍ය ආයතන 22 ක පිළිවෙලින් රු.550,525 ක සහ රු.1,880,878 ක කල් ඉකුත්වූ ඖෂධ තොග පැවතුණි.

(ඌ) ගල්ගමුව මූලික රෝහලේ 2017 වර්ෂය අවසානය වන විට එකතුව රු.100,134,172 ක් වූ ශල්‍ය වෛද්‍ය උපකරණ සහ රු.17,868,300 ක් වූ වෛද්‍ය වායු පද්ධතිය මාස 03 සිට මාස 20 දක්වා වූ කාලයක් අභාවිතව පැවති අතර ඇතැම් වෛද්‍ය උපකරණවල වගකීම් කාලය භාවිතයෙන් තොරවම අවසන්ව තිබුණි.

(එ) ලුණුවිල ප්‍රාදේශීය රෝහලේ රු.989,856 ක් වැයකර කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර මාස 08 ක කාලයක් ගතවී තිබුණද, ඉන් ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

(ඒ) රෝගීන්ගේ සෞඛ්‍ය තොරතුරු පරිගණකගත කිරීම සඳහා 2012 වර්ෂයේදී දඹදෙනිය මූලික රෝහලේ අංශ 06 ක් වෙත ලබාදී තිබූ පරිගණක යන්ත්‍ර 12 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඔ) 2016 වර්ෂයේ ගංවතුර ආධාර ලෙස චීනයෙන් වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට ලැබුණු සොස් පැන් 1,440 ක් සහ ඇඳුම් 2,398 ක් අතරින් සියයට 86 ක් වර්ෂ 02 කට ආසන්න කාලයක් බෙදා නොහැර ගබඩාකර තිබුණි. බෙදා හැර තිබු භාණ්ඩ අතරින් සියයට 31 ක් වු භාණ්ඩ අරමුණින් බැහැරව තෑගි භාණ්ඩ ලෙස ලබාදී තිබුණි.

6.7 හඳුනා ගන්නා ලද පාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගල්ගමුව මූලික රෝහලට නළ ළිඳක් ඉදිකිරීම සඳහා රු.2,253,856 ක් වැයකර තිබුණද, එහි ජලය බීමට සුදුසු නොවන බව ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය දැනුම් දී තිබුණි. මේ අනුව නිසි ශක්‍යතාවයක් නොමැතිව කටයුතු කිරීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.2,253,856 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) හෙට්ටිපොල ප්‍රාදේශීය රෝහලේ ඉදිකර තිබුණු නළ ළිඳේ ජලය බීමට සුදුසුව තිබියදී බාහිරින් ජලය මිලදී ගැනීම සඳහා 2015 – 2017 කාලය තුල රු.652,325 ක් වැයකර තිබුණි.

6.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුලි/ශාන්ත ජෝශප් විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල 6 වෙනි බිල්පත අනුව ඉටු කර නොතිබුණු වැඩ විෂයයන් 20 ක් සඳහා රු.767,139 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) පන්නල ජාතික පාසලේ ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීමේදී සියයට 40 ක අතිරේක වැඩ සඳහා පළාත් මූල්‍ය රීති 34.2 ප්‍රකාරව විධිමත් අනුමැතියකින් තොරව රු. 1,931,484 ක් ගෙවා තිබුණි.

(ඇ) සාරිපුත්‍ර සහ ගෝනුල්ල යන ප්‍රාථමික විද්‍යාලවල දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම, පන්නල ජාතික පාසලේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, පන්නල ජාතික පාසලේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම සහ අල් අමීන් විද්‍යාලයේ දෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඇස්තමේන්තුවලට ඇතුලත් නොවූ විෂයයන් වෙනුවෙන් එකතුව රු. 4,393,926 ක් ගෙවා තිබුණි.

(ඈ) නික/ කඩිගාව මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල, මහකෙළිය මහා විද්‍යාලයේ දෙමහල් තාක්ෂණික ගොඩනැගිල්ල සහ කිලින්පොල ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරුවන් වෙත එකතුව රු. 14,457,675 ක අත්තිකාරම් ලබාදී මාස 04 සිට මාස 12 දක්වා කාලයක් ගතවී

තිබුණද ලබා දුන් අත්තිකාරම් මුදලට සරිලන ප්‍රමාණවත් වැඩ කොටසක් ඉටු කර නොතිබුණු බව 2018 පෙබරවාරි 01 දින සිදුකළ භෞතික පරීක්ෂාවට අනුව නිරීක්ෂණය විය.

(ඉ) කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිගත කිරීමේ සීමාවන්ට අනුව සී - 2 කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවෙකුට වර්ෂයක් තුළ ලබා දිය හැකි උපරිම කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 240 ක් වුවද වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පමණක් 2016 වර්ෂය තුල රු.මිලියන 245.63 ක කොන්ත්‍රාත් පෞද්ගලික ඉදිකිරීම් ආයතනයකට ප්‍රදානය කර තිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට පවරා තිබූ ව්‍යාපෘති 05 ක් 2018 ජූනි 06 දින වන විටත් නිම කර නොතිබුණු අතර, වැඩ අවසන් කර තිබූ ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් ගිවිසුම් ගත කාල සීමාව ඉක්මවා දින 272 සිට දින 545 ක් ගත කර තිබුණද එම කොන්ත්‍රාත් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(උ) වයඹ ඉංජිනේරු අධ්‍යක්ෂගේ 01/2017 තාක්ෂණික උපදෙස් ලිපිය මගින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත බලය පැවරීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සීමාව ඉක්මවා කුලියාපිටිය හා වාරියපොල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මගින් පමණක් පිළිවෙලින් රු. 28,441,294 ක සහ රු. 5,211,733 ක කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ඌ) මදුරන්කුලිය සංචාරක මධ්‍යස්ථානයේ උද්‍යාන අලංකරණ කටයුතු පිළිබඳව 2018 ජූනි 30 දින සිදුකල ස්ථානීය පරීක්ෂාව අනුව ඉටු නොකල වැඩ සඳහා රු.1,365,489 ක් හා අඩුවෙන් ඉටු කල වැඩ සඳහා රු. 663,871 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(එ) ගිවිසුම අනුව 2017 ජූනි 29 දින වැඩ ආරම්භ කර 2017 ඔක්තෝබර් 27 දින වැඩ අවසන් කළයුතු ඇස්තමේන්තු වටිනාකම රු.10,386,969 ක්වූ උඩප්පුව රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය පිළිබඳ 2018 ජනවාරි 30 දින භෞතික පරීක්ෂාවට අනුව කෙරෙමින් පැවති රු.1,334,378 ක්වූ විෂයයන් 12 ක් නිමි වැඩ ලෙස මිනුම් වාර්තාවට ඇතුලත් කර 2017 දෙසැම්බර් 31 දින ගෙවීම් කර තිබුණි. ප්‍රමාද කාලය සඳහා දඩ රු.176,562ක්ද අයකරගෙන නොතිබුණි.

6.9 කාර්ය මණ්ඩල පරිපාලනය
----------------------------

2017 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 717 | 542 | 175 |
| තෘතියික මට්ටම | 320 | 203 | 117 |
| ද්විතියික මට්ටම | 5,244 | 4,330 | 914 |
| ප්‍රාථමික මට්ටම | 1,414 | 1,330 | 84 |
| එකතුව | 7,695 | 6,405 | 1,290 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය (කලාප කාර්යාල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1,915 | 1,347 | 568 |
| ගුරුභවතුන් | 26,383 | 23,918 | 2,465 |
| සුළු සේවක | 2,696 | 2,502 | 194 |
| වෙනත් | 503 | 324 | 179 |
| එකතුව | 31,497 | 28,091 | 3,406 |

(ඇ) රෝහල් කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රෝහල් කාර්යය මණ්ඩලය | 7,101 | 5,882 | 1,639 | 420 |
| කාර්යාලීය කාර්යය මණ්ඩලය | 1,657 | 1,473 | 184 | - |
| එකතුව | 8,758 | 7,355 | 1,823 | 420 |

(ඇ) අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පෞද්ගලික ලේකම් | 05 | 05 | - | - |
| සම්බන්ධීකරණ ලේකම් | 06 | 05 | 01 | - |
| මාධ්‍ය ලේකම් | 02 | 02 | - | - |
| මහජන සම්බන්ධතා නිලධාරි | 05 | 05 | - | - |
| පෞද්ගලික සහකාර | 05 | 05 | - | - |
| කළමනාකරණ සහකාර | 13 | 13 | - | - |
| කාර්යාල කාර්ය සහයක | 10 | 10 | - | - |
| වෙනත් (රියදුරු) | 10 | 13 | - | 03 |
| එකතුව | 56 | 58 | 01 | 03 |

(ඉ) පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 16 | 12 |
| තෘතියික මට්ටම | 48 | 17 | 31 |
| ද්විතියික මට්ටම | 1,307 | 879 | 428 |
| ප්‍රාථමික මට්ටම | 3,369 | 3,169 | 200 |
| එකතුව | 4,752 | 4,081 | 671 |

(ඊ) ප්‍රඥප්ති මඟින් පිහිට වූ ආයතන කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 20 | 15 | - |
| තෘතියික මට්ටම | 36 | 63 | - | 27 |
| ද්විතියික මට්ටම | 211 | 180 | 31 | - |
| ප්‍රාථමික මට්ටම | 277 | 213 | 64 | - |
| එකතුව | 559 | 476 | 110 | 27 |

සටහන : පළාත් සභා මන්ත්‍රීවරුන්ට 183 ක ආදේශක කාර්ය මණ්ඩලයක් පැවතුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

6.9.1 පළාත් සභා හා පළාත්පාලන (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) ආයතනවල කාර්ය මණ්ඩලය

වයඹ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්, සේවයේ ස්ථිර කිරීම් හා උසස් කිරීම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වුවද, 2012 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභා 13 ක් සඳහා ලේකම් තනතුරේ රාජකාරි ආවරණ සඳහා පත් කිරීම් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් සිදුකර තිබුණි.

6.9.2 පාසල් කාර්ය මණ්ඩලය

(අ) වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කළාප කාර්යාල 03 ක, කොට්ඨාශ කාර්යාලයක හා පාසල් 125 ක සේවයේ නියුතු සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු ඇතුළු නිලධාරීන් හා සේවකයින් 200 දෙනෙකුගේ සේවය විවිධ හේතුමත ස්ථිර කර නොතිබූ අතර, ඇතැම් ගුරුභවතුන්ගේ සේවය පත්වීම් දින සිට වර්ෂ 28 ක් පමණ ගතවී තිබුණද ස්ථිර කිරීම් සිදුව නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛයේ 3.2 ඡේදය පරිදි වඩාත් පහසු පාසල් වර්ගයට අයත් පාසලක ගුරුභවතුන්ගේ උපරිම සේවා කාලය අවුරුදු 06 ක් වුවද අවුරුදු 06 සිට අවුරුදු 26 ක් දක්වා එකම පාසලේ සේවයේ නිරතව සිටින ගුරුභවතුන් 536 දෙනෙකු සිටින බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඇ) විෂයන් 67 කට අදාලව ගුරු පුරප්පාඩු 1,503 ක් වූ අතර, ඉන් ප්‍රධාන විෂයන් වන ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් සඳහා ගුරු පුරප්පාඩු පිළිවෙලින් 145 ක් 64 ක් හා 132 ක් විය. මෙම පුරප්පාඩු හේතුවෙන් විෂයට ප්‍රවීනතාවයක් නොමැති ගුරුභවතුන් එම පුරප්පාඩු විෂයන්වල ඉගැන්වීමේ කටයුතුවල නිරත කර තිබුණි.

(ඈ) හලාවත අධ්‍යාපන කලාපයේ වර්ෂ 6-10 දක්වා ස්ථාන මාරු නොලැබූ ගුරුවරු 961 ක් සේවයේ යෙදී සිටියදී අනුප්‍රාප්තිකයෙකු නොමැතිවීම හා අසම්පූර්ණ අයදුම්පත් හේතුවෙන් ගුරු ස්ථාන මාරු අයදුම්පත් 114 ක් ප්‍රතික්ෂේප වී තිබුණි.

(ඉ) හලාවත කලාප ගුරු මාරු අභියාචනා මණ්ඩලයේ සභාපති ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයෙකු නොසිටි අතර, ගුරු ස්ථාන මාරු මණ්ඩලය නියෝජනය නොකළ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුද අභියාචනා මණ්ඩලයට පත්කර නොතිබුණි.

(ඊ) වයඹ පළාතේ පාසල් 299 ක සිටිය යුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් වෙනුවට ඊට වඩා පහල ශ්‍රේණියක විදුහල්පතිවරුන්ද, පාසල් 153 ක ඉහල ශ්‍රේණියක විදුහල්පතිවරුන්ද, පාසල් 158 ක ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන්ද, විදුහල්පති තනතුරුවල රාජකාරි ඉටු කරමින් තිබුණි.

6.9.3 සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය
------------------------------------

(අ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩල විස්තරය අනුව තනතුරු 04 ක නිලධාරීන් 194 ක පුරප්පාඩු හා එක් තනතුරක නිලධාරීන් 03 ක් අතිරික්තව පැවතුණි.

(ආ) 2017 වර්ෂය වන විට වයඹ පළාතේ ජනගහනයෙන් 100,000 කට වෛද්‍යවරු 36 ක් හා හෙද කාර්යය මණ්ඩලය 55 ක් විය. දිවයින තුල එම අනුපාතය වෛද්‍යවරු 55 ක් හා හෙද කාර්යය මණ්ඩලය 175 ක්වූ බැවින් වයඹ පළාත තුල රෝගී සත්කාරක සේවය සඳහා වූ කාර්යය මණ්ඩලයේ හිඟතාවයක් පැවතුණි.

(ඇ) වයඹ පළාතේ රෝහල් හා සෞඛ්‍ය වෛද්‍ය ආයතනවල සේවයේ නියුතු ඉසින යන්ත්‍ර ක්‍රියාකරුවන් 154 දෙනෙකුට තනතුරට අදාල රාජකාරියක් නොතිබුණි.

(ඈ) නවීකරණය කරන ලද ගල්ගමුව රෝහලේ රෝගී සත්කාරක සේවා ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරු 16 ක්, වෛද්‍යවරු 94 ක් සහ හෙද/ හෙදියන් 150 ක් සිටිය යුතු වුවත් 2017 වර්ෂය අවසන් වනවිට අනුයුක්ත කර තිබුණේ විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු, වෛද්‍යවරුන් 18 දෙනෙකු හා හෙද/ හෙදියන් 53 ක් පමණි.

(ඉ) විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ඇතුළු රෝහල් 06 ක වෛද්‍ය, හෙද, කළමනාකරණ සහකාර සහ සුළු සේවකයන් 357 දෙනෙකු වර්ෂ 05 සිට 28 දක්වා කාලයක් එකම ස්ථානයේ සේවය කරමින් තිබුණි.

6.10 බැංකු ගිණුම්
---------------

හලාවත සමුපකාර උපකොමසාරිස් කාර්යාලයේ තීරක කටයුතු පිළිබඳ ජංගම ගිණුමේ වූ රු.11,133,126 ක ශේෂයක් අදාල පාර්ශවයන් වෙත නිරවුල් නොකර දිගු කාලයක් රඳවා තබාගෙන තිබුණි.

**07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**7.1 අයවැය ලේඛනමය පාලනය**

පළාත් සභා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ආයතන 09 කට අදාලව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කටයුතු සම්බන්ධයෙන් වියදමෙහි උපරිම සීමාව ඉක්මවීම්වල එකතුව රු. 5,287,644 ක් විය.

**08. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) හිඟ ආදායම් ගිණුම්ගත නොකිරීම<br>(ii) දුර්වල වැය ලෙජර පාලනය |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | (i) සේවක පරිපාලනයේ දුර්වලතා පැවතීම<br>(ii) කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම |
| (ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (i) ව්‍යාපෘති සැලසුම් කිරීමේ දුර්වලතා පැවතීම<br>(ii) ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතා පැවතීම<br>(iii) පසු විපරම් කටයුතු සිදු නොකිරීම |
| (ඇ) ප්‍රඥප්ති මත පිහිට වූ ආයතනවල මූල්‍ය කටයුතු හා මෙහෙයුම් පාලනය | (i) ආදායම් උපයාගැනීමට කටයුතු නොකිරීම<br>(ii) ණය කළමනාකරණයේ දුර්වලතා පැවතීම<br>(iii) වත්කම් කළමනාකරණයේ දුර්වලතා පැවතීම |
| (ඉ) වාහන පාලනය | (i) අලුත්වැඩියා හා නඩත්තු විධිමත්ව සිදු නොකිරීම<br>(ii) හානි සම්බන්ධ පරීක්ෂණ කඩිනමින් සිදු නොකිරීම |